

4

ස්ටීවන් හෝකින්

නීරෝගී දරුවකු ලෙස මෙලොව එළිය දැක, නව යොවුන් වියේ දී දරුණු ලෙස රෝගාතුර වී ඇවිදීමේ සහ කථා කිරීමේ හැකියාව අහිමි වූ ඔහු මේ කිසිවක් සිය ජීවිතයට බාධා කර ගත්තේ නැත. සැබැවින් ම ඔහුගේ ජීවිත කථාව විස්මයජනක ය; ආදර්ශවත් ය. කුඩා කල පටන් ලෝකයේ පවතින සියල්ල පැහැදිලි කිරීම සඳහා එක් න්‍යායක් සෙවීම සඳහා වෙහෙස වූ සහ පර්යේෂණ කළ ඔහු, සාධාරණ සාපේක්ෂතාවාදය යටතේ න්‍යායාත්මක සංසිද්ධි කිහිපයක් සම්බන්ධයෙන් ලොව පිළිගත් නව මත ඉදිරිපත් කිරීමට සමත් විය. ස්ටීවන් හෝකින් කළු කුහරවලින් පිට වන විකිරණය හෙවත් හෝකින් විකිරණය පිළිබඳ න්‍යායාත්මක සාධක රැසක් ඉදිරිපත් කළ විද්වතෙකි. ඔහු පිළිබඳ මේ ලිපිය සම්පාදනය කරන ලද්දේ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ භෞතික විද්‍යා අධ්‍යයනාංශයේ ආචාර්ය මධුරංග ප්‍රනාන්දු විසිනි.

ඔහු ලෝක ප්‍රකට, ඉහළ පෙළේ භෞතික විද්‍යාඥයෙකි; න්‍යායාත්මක භෞතික විද්‍යාඥයෙකි. (Theoretical physicist); විශ්ව න්‍යායවේදියෙකි (Cosmologist). මේ සියල්ලටත් වඩා විශේෂයෙන් අවධානය යොමු කළ යුතු කරුණ වන්නේ ඔහුට ජීවිත කාලය පුරා ම අබාධිත පුද්ගලයකු ලෙස ගත කිරීමට සිදු වීම යි. එනම්, ඔහු චාලක නියුරෝන ආබාධය Motor Neuron Disease) හෙවත් ALS (Amyotrophic Lateral Sclerosis) නම් රෝගයෙන් අධික ලෙස පීඩා විඳින්නෙකි. ශරීරය අප්‍රාණික, එක අතක එක් ඇඟිල්ලක් පමණක් ක්‍රියා කරන මෙන් ම කථා කිරීමේ හැකියාව අහිමි මේ අසහාය මිනිසා අන් කිසිවකු නොව ඔබ හොඳින් දන්නා ස්ටීවන් හෝකින් ය. මේ ආබාධ කිසිවක් සිය ජීවන ගමනට බාධා නො කර ගෙන නොසැලී ජීවිතයට මුහුණ දීමට ඔහු සතු වූ දිරිමත්කම සැබැවින් ම අගය කළ යුතු ය. කේම්බ්‍රිජ් විශ්වවිද්‍යාලය යටතේ පවතින න්‍යායාත්මක විශ්වන්‍යාය පිළිබඳ පර්යේෂණ ආයතනයේ (Centre for Theoretical Cosmology) අධ්‍යක්ෂ ධුරය හොබවන අතර ලොව ප්‍රමුඛ පෙළේ ග්‍රන්ථ කතුවරයකු ලෙස කීර්තියක් දිනා ගැනීමට හෝකින්ට හැකි වූයේ ඔහු සතු විස්මයජනක ධෛර්යය නිසා ම ය.

1942 ජනවාරි මස 08 වැනි දින එංගලන්තයේ ඔක්ස්ෆර්ඩ් නගරයේ උපත ලද නීරෝගි දරුවා ස්ටීවන් විලියම් හෝකින් ලෙස නම් කෙරිණි. ඔහුගේ පියා වන ෆ්‍රැන්ක් හෝකින් සහ මව වන ඉසබෙල් හෝකින් යන දෙදෙනා ම ඔක්ස්ෆර්ඩ් විශ්වවිද්‍යාලයේ උපාධිධාරීන් පමණක් නො ව, සමාජයේ පිළිගත් උගත්තු ද වූහ. මේ දෙපළට හෝකින්ට අමතරව පිලිෆා හා මේරි නම් දූවරු දෙදෙනෙක් ද කුඩා කල සිට හදා වඩා ගත් එඩ්වඩ් නම් පුතෙක් ද වූහ. හෝකින් සිය අධ්‍යාපන කටයුතු ආරම්භ කළේ ලන්ඩනයේ හයිගේට් නගරයේ බයිරොන් පාසලෙනි. අනතුරුව පාසල් කිහිපයකින් ම අධ්‍යාපනය ලැබූ ඔහු 1959 දී එනම්, වයස අවුරුදු දාහතේ දී උසස් අධ්‍යාපන කටයුතු සඳහා ඔක්ස්ෆර්ඩ් විශ්වවිද්‍යාලයට ඇතුළත් විය.

ඔක්ස්ෆර්ඩ් විශ්වවිද්‍යාලයේ ගත කළ මුල් අවධියේ දී හෝකින් හුදෙකලාව ප්‍රිය කරන ශිෂ්‍යයකු ලෙස ප්‍රසිද්ධියට පත්ව සිටි අතර පසුව පෞරාණික භෞතික විද්‍යාවට හා විද්‍යා ප්‍රබන්ධවලට දැඩිව ඇලුම් කරන ශිෂ්‍යයකු ලෙස ප්‍රසිද්ධියට පත් විය. එම විෂයය මෙන් ම න්‍යායාත්මක භෞතික විද්‍යාව ද ඔහුට ප්‍රියජනක විෂයයක් විය. ඔක්ස්ෆර්ඩ් විශ්වවිද්‍යාලයේ ඉගෙනුම ලැබූ අවසන් වසර හෝකින්ගේ ජීවිතයේ තීරණාත්මක වර්ෂය යි. මේ කාලයේ දී ඔහු නිතර සිහිමූර්ඡා වී වැටෙන්නට විය. ඒ ඔහුගේ චාලක නියුරෝන ආබාධයේ ප්‍රථම රෝග නිදානය යි. මේ තත්ත්වය යටතේ වුව ද හෝකින් 1926 දී ප්‍රථම පන්ති සාමර්ථ්‍යයක් සහිතව ස්වාභාවික විද්‍යාව පිළිබඳ ගෞරව උපාධිය දිනා ගැනීම වූ කලී ඔහුගේ විශිෂ්ටත්වය විදහා පෙන්වීමකි.

සිය ආචාර්ය උපාධිය සඳහා ඔහු විසින් තෝරා ගනු ලැබුවේ සාධාරණ සාපේක්ෂතාවාදය හා විශ්වන්‍යාය යන විෂය ක්ෂේත්‍ර යි. මේ අවධිය වන විට හෝකින් සිය රෝගය නිසා නිතර පීඩා විඳි අතර, ඇවිදීමේ දී පවා ඔහුට දැනුණේ විශාල අපහසුතාවකි. මේ අභියෝග

මධ්‍යයේ වුව ද 1966 දී ඔහු සිය ආචාර්ය උපාධිය දිනා ගත්තේ ය. ඒ ව්‍යවහාරික ගණිතය හා න්‍යායාත්මක භෞතික විද්‍යාව යන විෂය ක්ෂේත්‍ර යටතේ 'සාධාරණ සාපේක්ෂතාවාදය හා විශ්වන්‍යාය' පිළිබඳ විශේෂඥ දැනුමක් සහිත විද්වතකු ලෙස ය. 'කාල අවකාශයේ අපූර්වතා හා ජ්‍යාමිතිය' (Singularities and the Geometry of Space - Time) නම් වූ හෝකින්ගේ එම පර්යේෂණ කෘතියට එම වර්ෂයේ ඇඩම්ස් ත්‍යාගය ද හිමි විය. ඉතා ප්‍රබල රෝගයකින් දරුණු ලෙස පීඩා විඳිමින් මේ සා මහත් අධ්‍යයන කටයුත්තක නියැළී එය අතිසාර්ථක ලෙස අවසන් කිරීමට තරම් හෝකින් සතු වූ චිත්ත ශක්තියත් අසමසම ඥාන මහිමයත් ප්‍රශංසාවට බඳුන් වන්නේ ම ය.

ඔහු 1970 දී කැලිෆෝනියා තාක්ෂණික ආයතනයේ (Caltech) බාහිර මහාචාර්යවරයකු ලෙස ද කටයුතු කෙළේ ය. 1977 දී හෙවත් ඔහුගේ වයස අවුරුදු 35 දී ඔහු ඔක්ස්ෆර්ඩ් විශ්වවිද්‍යාලයේ ගුරුත්වාකර්ෂණ භෞතික විද්‍යාව පිළිබඳ මූලාසනාරූඪ මහාචාර්ය තනතුරෙන් පිදුම් ලැබුවේ ය. එය ඔහුගේ වයසට සාපේක්ෂව ඔහුගේ දක්ෂතාව සඳහා ලද ඉතා ඉහළ තනතුරකි. එමෙන් ම මේ වන විට හෝකින් ලෝක පූජිත ගෞරව නාම, ත්‍යාග, පදක්කම් හා සම්මාන විශාල සංඛ්‍යාවක් දිනා ගෙන ඇත. ඒ අතරින් ඇඩම්ස් සම්මානය (1966), එෆ්.ආර්.එස්. (1974), එඩින්ටන් පදක්කම (1975), මැක්ස්වෙල් පදක්කම සහ ත්‍යාගය (1976), හෙයින්මාන් ත්‍යාගය (1976), හග්ස් පදක්කම (1976), ඇල්බට් අයින්ස්ටයින් සම්මානය (1978), ඩයිරැක් පදක්කම (1987), වුල්ෆ් සම්මානය (1988), නිදහස සඳහා වූ ජනාධිපති සම්මානය (2009) වැනි ඉතා ඉහළ ගණයේ ත්‍යාග, පදක්කම් හා සම්මාන රාශියකට ඔහු හිමිකම් කියයි.

1970 දී, හෝකින් "විශ්වය සාධාරණ සාපේක්ෂතාවාදය අනුව හැසිරේ නම් ඇලෙක්සැන්ඩර් ෆ්‍රයිඩ්මාන් විසින් ඉදිරිපත් කොට ඇති භෞතික විශ්වන්‍යායේ එන සියලු ම න්‍යායයන්ට එකඟ විය යුතු ය," යන පර්යේෂණ පත්‍රිකාව ප්‍රකාශයට පත් කෙළේ ය. එම වසරේ දී ම ඔහු 'කළු කුහර ගතිවිද්‍යාව පිළිබඳ දෙවන නියමය' මෙන් ම 'කළු කුහර යාන්ත්‍ර විද්‍යාව සම්බන්ධ නියම හතර' වැනි ඉහළ න්‍යායයන් ප්‍රකාශයට පත් කළේ ය. 1973 දී ඔහුගේ පර්යේෂණ විෂය ක්ෂේත්‍ර ක්වන්ටම් භෞතික විද්‍යාව හා ක්වන්ටම් ගුරුත්වය යන විෂය ධාරාවලට යොමු වූ අතර, ඔහුගේ පර්යේෂණ පත්‍රිකා එම ක්ෂේත්‍රවලට ගොනු විය. එමෙන් ම අද වන විට ඉතා ඉහළ පර්යේෂණ සංග්‍රහවල හෝකින්ගේ ප්‍රමුඛ පෙළේ පර්යේෂණ පත්‍රිකා 200කට වැඩි සංඛ්‍යාවක් ප්‍රකාශයට පත් වී ඇත. එය පර්යේෂකයකු ලෙස ඔහු ලබා ඇති ඉහළ පිළිගැනීම විදහා දක්වයි.

1971 වසරේ දී ජෝර්ජ් එලිස් සමග එක්ව ඔහුගේ පළමු ග්‍රන්ථය වන **කාලය හා අවකාශය පිළිබඳ මහා පරිමාණයේ ව්‍යූහය** සම්පාදනය කළේ ය. එය 1973 දී ප්‍රකාශයට පත් කරන ලදි. ඉන් අනතුරුව, 1988 දී **කාලය පිළිබඳ කෙටි හැඳින්වීමක්**, 1933 දී **කළු කුහර, ළදරු විශ්වයන් සහ අනෙකුත් පත්‍රිකා**, 1966 දී රොජර් පෙන්රෝස් සමග **කාලය සහ අවකාශයේ**

ස්වභාවය, 1997 දී තවත් කිහිපදෙනකු සමග එක්ව **ලොකු - කුඩා සහ මිනිස් මනස**, 2001 දී **කටුවක් තුළ ඇති විශ්වය**, 2002 දී **යෝධයන්ගේ උර මතින්** සහ එම වසරේ දී ම තවත් කිහිප දෙනකු සමග එක්ව **කාල අවකාශයේ අනාගතය**, 2005 දී **දෙවියන් මැවූ පූර්ණ සංඛ්‍යා**, 2010 දී ලෙනාඩ් ම්ගෝඩිනෝ සමග **මහා රටාව**, 2011 දී **'වල්පල්වලින් සැදුණු සිහින: ක්වන්ටම් භෞතික විද්‍යා පත්‍රිකා'** සහ 2013 දී **'මගේ කෙටි හැඳින්වීම'** නමැති ලෝක ප්‍රසිද්ධ මෙන් ම ඉතා ඉහළ අලෙවි වාර්තා තැබූ පොත් රාශියක කතුවරයා විය. මේ පොත් ගොන්නෙහි විශිෂ්ට කතුවරයා ලෙස හෝකින් ඉතා ඉහළ දැනුම් සම්භාරයක් ලොවට තිළිණ කර ඇත.

මීට අමතරව ඔහු ලෝක සාමය පවත්වා ගැනීම උදෙසා ලෝක යුද්ධවලට එරෙහිව, පරිසර විනාශයට හා පරිසර උණුසුම් වීම නවතා ලීමට මෙන් ම පරිගණක වෛරසවලට විරුද්ධව පවා තම මතය නොබියව ඉදිරිපත් කරමින් ඒවාට විරුද්ධව අරගල කළ සැබෑ මිනිසකු බව ද පැවසිය යුතු ය. තව ද ඔහු භෞතික විද්‍යා න්‍යායයන් විසින් මේ ලොව පාලනය කෙරෙන බව පිළිගත් විද්වතෙකි.

විශිෂ්ට ගුණාංග රැසකින් හා මනා පෞරුෂයකින් සමන්විත මේ විශේෂ චරිතය පිළිබඳ ග්‍රන්ථ රාශියක් ලියා දැක්විය හැකි ය. ජීවිතයේ අනපේක්ෂිත බිඳ වැටීම් සමූහයක් හමුවේ අකම්පිතව ඊට මුහුණ දී ලොව දස දිගෙහි ජය දද නැංවූ විද්වතකු ලෙස කීර්තියක් අත් කර ගැනීමට සමත් වූ මේ අසහාය මිනිසාගේ ජීවිතය සියලු දෙනාට ම මහත් ආදර්ශයකි. මෙතරම් සුවිසල් ජීවන අභියෝග හමුවේ පවා නොසැලී ස්ටීවන් හෝකින් සිදු කළ මෙහෙය පිළිබඳ විමසා බලන කල, ඉදිහිට අපට මුහුණ දීමට සිදු වන සුළු සුළු අභියෝග මැඩපවත්වා ගත හොත් අපට නො කළ හැකි දෙයක් නැති බව ඔබට වැටහෙනු ඇත.

අවබෝධය

1. **හෝකින් ප්‍රිය කළ විෂය මොනවා ද?**
2. **තම ආචාර්ය උපාධිය සඳහා මේ විද්වතා තෝරා ගත් විෂය ක්ෂේත්‍රය කුමක් ද?**
3. **හෝකින්ගේ ආචාර්ය උපාධි නිබන්ධය සඳහා හිමි වූ ත්‍යාගය නම් කරන්න.**
4. **ස්ටීවන් හෝකින්ට හිමි වූ තනතුරු සහ සම්මාන වෙන් වෙන් ව දක්වන්න.**
5. **මේ චරිතය පිළිබඳ ඔබට ඇති වන හැඟීම විස්තර කරන්න.**



සිංහල අක්ෂර මාලාව

වර්තමානයේ භාවිත වන සිංහල අක්ෂර මාලාව අක්ෂර හැටකින් යුක්ත වෙයි. පහත සඳහන් වන්නේ එම අක්ෂර මාලාව යි.

අ	ආ	ඇ	ඈ	ඉ	ඊ
උ	ඌ	ඍ	ඎ	ඏ	ඐ
එ	ඒ	ඓ	ඔ	ඕ	ඖ
(අ)ං	(අ)ඃ				
ක	ඛ	ග	ඝ	ඞ	ඟ
ච	ඡ	ජ	ඣ	ඤ	ඦ
ට	ඨ	ඩ	ඪ	ණ	ඬ
ත	ථ	ද	ධ	න	ඳ
ප	ඵ	බ	භ	ම	ඹ
ය	ර	ල	ව		
ශ	ෂ	ස	හ	ළ	ෆ

සිංහල අක්ෂර මාලාව ස්වර (ප්‍රාණාක්ෂර) හා ව්‍යඤ්ජන (ගාත්‍රාක්ෂර) වශයෙන් කොටස් දෙකකට බෙදේ.

ස්වර

වෙනත් අක්ෂරයක (ශබ්දයක) උපකාරයකින් තොරව, තනිව උච්චාරණය කළ හැකි අක්ෂර ස්වර නම් වේ. ස්වර ශබ්ද නිරූපණය කිරීමට යෙදෙන අක්ෂර ප්‍රාණාක්ෂර (පණකුරු) නම් වේ. ස්වර 18කි.

අ	ආ	ඇ	ඈ	ඉ	ඊ
උ	ඌ	ඍ	ඎ	ඏ	ඐ
එ	ඒ	ඓ	ඔ	ඕ	ඖ

ව්‍යඤ්ජන

තනිව උච්චාරණය කළ නොහැකි, ස්වර සමග එකතු කිරීමෙන් පහසුවෙන් උච්චාරණය කළ හැකි අකුරු ව්‍යඤ්ජන අක්ෂර යි. ව්‍යඤ්ජන ශබ්ද නිරූපණය කිරීමට යොදන අක්ෂර ගාත්‍රාක්ෂර (ගතකුරු) නම් වේ.

ක් + අ = ක   ස් + අ = ස

ත් + ඉ = ති   ස් + උ = සු

සිංහල අක්ෂර මාලාවේ ව්‍යඤ්ජන අක්ෂර 42කි.

(අ)ං	(අ)ඃ				
ක	ඛ	ග	ඝ	ඞ	ඟ
ච	ඡ	ජ	ඣ	ඤ	ඦ
ට	ඨ	ඩ	ඪ	ණ	ඬ
ත	ථ	ද	ධ	න	ඳ
ප	ඵ	බ	භ	ම	ඹ
ය	ර	ල	ව		
ශ	ෂ	ස	හ	ළ	ෆ

මේ අක්ෂර තවත් අනුකොටස් රාශියකට බෙදා දැක්විය හැකි ය.

වර්ගාක්ෂර

සිංහල අක්ෂර මාලාවේ ‘ක’ අකුරේ සිට ‘ම’ අකුර දක්වා ඇති අක්ෂර වර්ගාක්ෂර ලෙස හැඳින්වෙයි. ශබ්ද උපදින ස්ථානය, අල්පප්‍රාණ - මහාප්‍රාණ භේදය හා ඝෝෂ - අඝෝෂ භේදය යන සාධක මත අක්ෂර මෙසේ වර්ග වශයෙන් පෙළ ගස්වනු ලැබේ.

‘ක’ අක්ෂරයෙන් ඇරඹෙන පේළියට අයත් අක්ෂර ‘ක’ වර්ගාක්ෂර යි.
‘ච’ අක්ෂරයෙන් ඇරඹෙන පේළියට අයත් අක්ෂර ‘ච’ වර්ගාක්ෂර යි.
‘ට’ අක්ෂරයෙන් ඇරඹෙන පේළියට අයත් අක්ෂර ‘ට’ වර්ගාක්ෂර යි.
‘ත’ අක්ෂරයෙන් ඇරඹෙන පේළියට අයත් අක්ෂර ‘ත’ වර්ගාක්ෂර යි.
‘ප’ අක්ෂරයෙන් ඇරඹෙන පේළියට අයත් අක්ෂර ‘ප’ වර්ගාක්ෂර යි.

නොමිලේ බෙදා හැරීම සඳහා ය.

ක - වර්ගය	ක	ඛ	ග	ඝ	ඞ
ච - වර්ගය	ච	ඡ	ජ	ඣ	ඤ
ට - වර්ගය	ට	ඨ	ඩ	ඪ	ණ
ත - වර්ගය	ත	ථ	ද	ධ	න
ප - වර්ගය	ප	ඵ	බ	භ	ම

මේ පාඩමේ දී විශේෂ අවධානය යොමු වන්නේ ඉහත වර්ගාක්ෂර උත්පත්ති ස්ථාන අනුව වර්ග කෙරෙන ආකාරය පිළිබඳව යි.

ශබ්ද උච්චාරණයේ දී මුඛයෙහි ඇති දිව, යටි දත් පෙළ හෝ යටි තොල යන මුඛ උපාංග උගුර, තල්ල, මුදුන, උඩු දත්, උඩු තොල ආදි චලනය නො වන මුඛ උපාංග කරා පැමිණ ස්පර්ශ වෙයි. එසේ ශබ්ද උච්චාරණයේ දී චලනය නොවන මුඛ උපාංග අක්ෂර උත්පත්ති ස්ථාන ලෙස හඳුනාගනු ලැබේ. මේ ආකාරයට අක්ෂර උත්පත්ති ස්ථාන අනුව සිංහල අකුරු වර්ග කෙරේ.

- කණ්ඨජ
- තාලුජ
- මූර්ධජ
- දන්තජ
- ඕෂ්ඨජ

කණ්ඨජ

කණ්ඨ යනු උගුර යි. කණ්ඨජ යනු 'උගුරින් උපදින' යන අරුත යි. ශබ්ද උච්චාරණයේ දී දිවේ පසු කොටස උගුර දෙසට ළං වීමෙන් උපදින ශබ්ද කණ්ඨජ නමින් හැඳින්වෙයි.

ක	ඛ	ග	ඝ	ඞ

තාලුජ

'තල්ල ආශ්‍රයෙන් උපදින' යන අදහස තාලුජ යන්නෙහි ඇත. දිවේ මැද කොටස තල්ලෙහි ගැටීමෙන් උපදින ශබ්ද තාලුජ ලෙස හැඳින්වෙයි.

ච	ඡ	ජ	ඣ	ඤ

මූර්ධජ

දිවේ අග කොටස උඩට නැමී, තල්ලෙහි මුදුනේ ගැටීමෙන් උපදින ශබ්ද මූර්ධජ ශබ්ද යි.

ට	ඨ	ඩ	ඪ	ණ

දන්තජ

දිවේ තුඩ දත් ඇන්දෙහි ගැටීමෙන් උපදින ශබ්ද දන්තජ ශබ්ද නම් වේ.

ත	ථ	ද	ධ	න

ඕෂ්ඨජ

ඕෂ්ඨජ යන්නෙහි අදහස තොල්වලින් උපදින යන්න යි. යටි තොල සහ උඩුතොල ගැටීමෙන් උපදින ශබ්ද ඕෂ්ඨජ ශබ්ද යි.

ප	ඵ	බ	භ	ම

වර්ගාක්ෂර උත්පත්ති ස්ථාන අනුව වර්ග කෙරෙන ආකාරය පහත සඳහන් වගුවෙහි දැක්වේ.

උත්පත්ති ස්ථාන	වර්ගය	ව්‍යඤ්ජන අක්ෂර				
කණ්ඨජ (උගුරෙන් උපදින)	‘ක’ වර්ගය	ක	ඛ	ග	ඝ	ඞ
තාලුජ වර්ගය (තල්ලෙන් උපදින)	‘ච’ වර්ගය	ච	ඡ	ජ	ඣ	ඤ
මූර්ධජ (තලු මුදුනෙන් උපදින)	‘ට’ වර්ගය	ට	ඨ	ඩ	ඪ	ණ
දන්තජ (දත් ඇසුරෙන් උපදින)	‘ත’ වර්ගය	ත	ථ	ද	ධ	න
ඕෂ්ඨජ (තොල් ඇසුරෙන් උපදින)	‘ප’ වර්ගය	ප	ඵ	බ	භ	ම

ලිඛිත අභ්‍යාස

1. 'ක' වර්ගයට අයත් අක්ෂර පමණක් ඇතුළත් වන පරිදි වචන තුනක් ලියන්න.
2. ඨ, ඪ, ණ යන අකුරු ඇතුළත් වන්නේ කුමන වර්ගයට ද?
3. පහත සඳහන් වර්ගාක්ෂර උත්පත්ති ස්ථානය අනුව නම් කරන්න.

ච - ග - ඤ - ධ - බ - ණ -
ප - ජ - ඨ - ඞ - භ -

4. නිවැරදි වරණය තෝරන්න.

i. ඕෂ්ඨජ අක්ෂර ඇතුළත් නොවන වචනය තෝරන්න.
(අ) තාලම්පට (ආ) ගැට බෙරය (ඉ) මද්දලය (ඊ) හක්ගෙඩිය

ii. ත වර්ගයට අයත් අකුරු පමණක් ඇතුළත් වචනය වන්නේ
(අ) තද්ධිත (ආ) කෘදන්ත (ඉ) තද්භව (ඊ) තත්සම යන්න යි.

iii. මූර්ධජ අක්ෂරයක් ඇතුළත් නොවන වචනය වන්නේ
(අ) පීඨය (ආ) පණිවිඩය (ඉ) ආරූඪ (ඊ) සංඛ්‍යාව යන්න යි.

ප්‍රායෝගික අභ්‍යාස

1. විවිධ මාධ්‍ය පරිශීලනය කර, ස්ටීවන් හෝකින්ගේ චරිතය පිළිබඳ තවත් විශේෂ තොරතුරු සොයා කුඩා පොතක් නිර්මාණය කරන්න.
2. 'හෝකින්ගේ චරිතයෙන් ගත හැකි ආදර්ශ' යන මාතෘකාව යටතේ වචන දෙසීයක පමණ රචනාවක් ලියන්න.
3. ඔබ දන්නා තවත් මෙබඳු චරිතයක් පිළිබඳ පන්තිය ඉදිරියේ කථාවක් ඉදිරිපත් කරන්න.